**සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2022**

**-----------------------------------------------------------------------**

සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත්වල මාර්ග කොටස් 06 ක කි.මී. 131.50 ක් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,628 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 81.75 ක් වූ අතර ඉන් රු. මිලියන 7,800 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 60 ක් සැපයීම සඳහා සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 2,828 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2013 ජුනි 03 දින ආරම්භ කරන ලද අතර, 2020 අගෝස්තු 05 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපාතිය අවසන් කරන දිනය 2022 අප්‍රේල් 09 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ඔරුගොඩවත්ත - අඹතලේ පාරේ අංක 4/3 පාලම පුළුල් කිරීමේ කටයුතු 2021 ඔක්තෝම්බර් මාසයේදී අවසන් කර තිබුණද, එම පාලමේ පිරිවැය 2022 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩවල සිට අවසන් කරන ලද වැඩවලට මාරු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සිවිල් වැඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 251.09 | පාලම් අංක. 4/3 සඳහා අවසන් ගෙවීම සිදු කරන ලද්දේ 2022.08.10 දින වන අතර රඳවා ගැනීමේ මුදල් 2023.03.13 දින නිදහස් කරන ලදී. ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ශේෂය සිවිල් වැඩවලට මාරු කිරීමේ කටයුතු 2023 වර්ෂයේදී කරනු ලැබේ. | සම්පූර්ණ කරන ලද මාර්ග පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනීකරණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 5 හි 43 (අ) වගන්තිය අනුව, එක් එක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අවසාන දිනයට පවතින විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ විදේශ විනිමය ගැලපීම් ප්‍රමිතියේ අවශ්‍යතා අනුව ගිණුම්ගත කර නොතිබුණි. | - | ව්‍යාපෘතියේ ආරම්භක අදියරේ සිටම ණය මුදලින් සිදුකරණු ලබන වියපැහැදම් (disbursements) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තාව මත පදනම්ව ගිණුම්ගත කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සත්‍ය වියපැහැදම් වාර්තා කර ඇත. එබැවින් 2022 දෙසැම්බර් 31 දිනට පැවති විනිමය අනුපාතය සලකා බැලුවේ නැත. කෙසේ වෙතත්, අවශ්‍ය උපදෙස් සඳහා මෙම කාරණය මහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ණය සඳහා ගෙවන ලද සමුච්චිත පොලිය ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය ශේෂය සහ කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 83.62 | එම පොළිය වාර්තා කිරීමේ අවශ්‍යතාවයක් නොමැති අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වැය විෂය යටතේ එවැනි පොලී සටහන් කරනු ලැබේ. ව්‍යාපෘතිය මුල් අදියරේ සිටම ණය සඳහා ගෙවන පොලිය මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කරනු නොලැබුවේ එබැවිනි. | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල පොලී සහ කැප කිරීම් ගාස්තු ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 04 හි 18 වැනි වගන්තිය අනුව, වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම අදාල වන ණය ගැනීමේ පිරිවැය එම වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය විසින් මා.සං.අ. මූල්‍ය පහසුකම් යටතේ අදාළ ණය ගැනීමේ පිරිවැය 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධනීකරණය කර නොතිබුණි. | - | ව්‍යාපෘති පිරිවැය මූල්‍යකරණය සඳහා මා.සං.අ. විසින් වරින් වර දේශීය බැංකුවලින් දිගුකාලීන ණය ලබාගෙන ඇත. ණය ගෙවීම් සම්බන්ධ සියළු මුදල් ප්‍රවාහ මා.සං.අ. පොත්වල ඇතුලත් කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතියේ කිසිදු සම්බන්ධයක් නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2.2 නොසැසඳූ ශේෂයන්

| මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. මිලියන | අනුරූප වාර්තා අනුව වටිනාකම<br>රු. මිලියන | අදාළ වාර්තා විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 112.57 | 48.5 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව ණය මුදලින් දරන ලද මුළු වියදම. | විදේශ සම්පත් දෙපාර්තමේන්තු වාර්තාව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තාවට අදාල සැසඳුම් ප්‍රකාශ මූල්‍ය ප්‍රකාශන සමග අමුණා ඇත. | වෙනස ලේඛනගත සාක්ෂි සමඟ සැසදිය යුතුය. |

## 2.3 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති,රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019. 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය පවත්වා ඇත්තේ එක් රැස්වීමක් පමණි. | COVID- 19 හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එක්රැස්වීම සීමා කර ඇති හෙයින්, සියලුම අමාත්‍යාංශවලට සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අවනත වීමට සිදු විය. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

**(අ) ඔරුගොඩවත්ත - අඹතලේ පාලම් අංක. 6/2 පුළුල් කිරීම**

| සංරචකය | කාර්යය | 2022 දෙසැම්බර් 31 දිනට<br>අපේක්ෂිත භෞතික කාර්ය සාධනය (%) | <br>අත්කරගත් කාර්ය සාධනය (%) | ප්‍රමාදය/විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| සිවිල් ඉදිකිරීම් | ඔරුගොඩවත්ත - අඹතලේ පාලම් අංක. 6/2 පුළුල් කිරීම | 100 | 82 | ඉදිකිරීම් කටයුතු 2020 ජනවාරි 17 දින ආරම්භ කර ඇති අතර 2021 අප්‍රේල් 13 දින අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, මුල් කොන්ත්‍රාත්තුව අවසන් වූ දින සිට මාස 08 කට වැඩි කාලයක් ගතවීමෙන් පසු 2022 | ජල සම්පාදන මණ්ඩලය නල එළීම සිදුකිරීම නිසා නොවැළැක්විය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය ලබාගෙන තිබුණේ සියයට 82 ක භෞතික ප්‍රගතියක් පමණි. පළමු කාල දීර්ඝ කිරීම (EOT) 2022 අගෝස්තු 15 දින කල් ඉකුත් වූ නමුත්, ඉදිරි කාලය සඳහා තවදුරටත් දින දීර්ඝ කිරීම් අනුමත කර නොමැති බව නිරීක්ෂණය වූ අතර කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 8.7 සහ 14.15 (ආ) වගන්තිවලට අනුව කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අය කිරීමට ව්‍යාපෘතිය අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හැකි තත්වයක් මතු විය. |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

කොන්ත්‍රාත් පොදු කොන්දේසි 8.3 වගන්තියට අනුව ඉදිකිරීම් වැඩසටහන සංශෝධනය කිරීමට සහ ඒ අනුව කාල දීර්ඝ කිරීම් ඉල්ලුම් කිරීමට කොන්ත්‍රාත්කරුට හිමිකමක් ඇත. මා.සං.අ. සභාපති විසින් 2023.07.06 දින පළමු කාල දීර්ඝ කිරීම අනුමත කරන ලද අතර දෙවන කාල දීර්ඝ කිරීම අනුමැතිය සඳහා 2023.08.29 දින ඉදිරිපත් කරන ලදී.

**විගණකගේ නිර්දේශය**

අතිරේක පිරිවැයකින් තොරව ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය.

**(ආ) ඉඩම් අත්පත් කර ගැනීම**

| සංරචකය | කාර්යය | 2022 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය (%) | 2022 දෙසැම්බර් 31 දිනට අත්කරගත් කාර්ය සාධනය (%) | ප්‍රමාදය/විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීම් | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම. | 238 | දක්වා නොමැත | ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2012 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය සම්පූර්ණ කර නොතිබුණි. ඉඩම් කැබලි 238 ක් සඳහා රු. මිලියන 153.7 ක වන්දි මුදලක් සහ ඉඩම් කැබලි 82 ක් සඳහා ප්‍රමාද පොලිය ලෙස රු. මිලියන 17.57 ක් 2022 දෙසැම්බර් 31 දිනට ගෙවා ඇති බව නිරීක්ෂණය විය. තවද, 2022 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම් කැබලි පිළිබඳ විස්තර සැපයීමට ව්‍යාපෘතිය අපොහොසත්ව ඇත. | අකාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණය සහ දුර්වල අධීක්ෂණය. |

| | |
|---|---|
| **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | එය අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිදු කරනු ලබයි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දක්වා 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිසිවක් නොමැති අතර 2023 සැප්තැම්බර් 30 දක්වා ලියාපදිංචි කිරීම් 34 ක් ඇත. |
| **විගණකගේ නිර්දේශය** | අතිරේක පිරිවැයකින් තොරව ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඔරුගොඩවත්ත - අඹතලේ පාර අංක. 6/1 පාලම පුළුල් කිරීමේ කටයුතු 2019 ඔක්තෝබර් 07 දින ආරම්භ කර 2021 ජනවාරි 02 දින නිම කිරීමට නියමිතව තිබුණි. 2022 මාර්තු 03 දින නිකුත් කරන ලද භාරදීමේ සහතිකයට අනුව ඉහත පාලම 2021 දෙසැම්බර් 15 දින නිම කළ බව සඳහන් වුවද, කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 10.1 උප වගන්තියට පටහැනිව පාලම භාර දෙන අවස්ථාවේ සියලුම මතුපිට වැඩ, පදික වේදිකාවේ ගල් ඇතිරීම සහ පාලම් පාදමෙහි කොන්ක්‍රීට් කොටස් ඇතිරීම, වීදි ආලෝකකරණය වැනි ප්‍රධාන කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි. තවද, ඉහත ඉතිරි වැඩ නිම කිරීම පිළිබඳ විස්තර විගණනයට ලබා දී නොතිබුණි. | කොන්ත්‍රාත්තුව පිළිබඳව ඉංජිනේරුවරයා, කොන්ත්‍රාත්කරු සහ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු, පාලම ගමනාගමනයට විවෘත කිරීම සඳහා ඉඩ සැලසීමට පාලම නැවත අත්කර ගැනීමට තීරණය විය. පවරා ගැනීමේ සහතිකයේ ඉතිරි වැඩ ලැයිස්තුව සඳහන්වන අතර එම ස්ථානයේ ජල සම්පාදන මණ්ඩලයේ වැඩ අවසන් වූ පසු එය සම්පූර්ණ කරන ලෙස ඉල්ලා ඇත. | අතිරේක පිරිවැයකින් තොරව ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |
| (ආ) | ඔරුගොඩවත්ත - අඹතලේ පාර අංක. 4/3 පාලම පුළුල් කිරීමේ කටයුතු 2019 ඔක්තෝබර් 03 දින ආරම්භ කර 2021 ජනවාරි 02 දින නිම කිරීමට නියමිතව තිබුණි. භාරදීමේ සහතිකයට අනුව පාලම 2021 ඔක්තෝම්බර් 26 දින නිම කළ බව සඳහන් වුවද, කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 10.1 උප වගන්තියට පටහැනිව පාලම භාර දෙන අවස්ථාවේ සියලුම පින්තාරු කිරීමේ කටයුතු, ගේබියන් බිත්ති ඉදිකිරීම, පාලමේ බිත්ති පිටුපස පිරිසිදු කිරීම සහ සුමට කිරීම වැනි ප්‍රධාන කාර්යයන් සහ පදික වේදිකාවේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත්, ඉහත ඉතිරි වැඩ කටයුතු අවසන් කිරීම පිළිබඳ සාක්ෂි විගණනයට ලබා දී නොතිබුණි. | ජල සම්පාදන මණ්ඩලයේ අහල් කැණීම් සහ නව නල මාර්ග ඇතිරීම නිසා ඉදිකිරීම් කටයුතුවලට බලපෑම් ඇති වීම නොවැළැක්විය හැකි තත්වයක් වන අතර, කොන්ත්‍රාත්කරු එම අමතර වැඩ සඳහා කාල දීර්ඝ කිරීම් ලබාගැනීමටත් අමතර පිරිවැය සඳහාද හිමිකම් කියති. පවරා ගැනීමේ සහතිකයේ ඇතුලත් ඉතිරි වැඩ ලැයිස්තුවේ සඳහන් ඉතිරි වැඩ ජල සම්පාදන මණ්ඩලය වැඩබිමේ වැඩ අවසන් කළ පසු සම්පූර්ණ කරන ලෙස ඉල්ලා ඇත. | අතිරේක පිරිවැයකින් තොරව ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

### 3.3 ඌන උපයෝජිත වත්කම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු. මිලියන 10,628.0 ක මුළු ප්‍රතිපාදනවලින් ව්‍යාපෘතිය වසර නවයකට පසු 2022 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 8,605.72 ක් පමණක් භාවිතා කර තිබුණි. එබැවින්, රු.මිලියන 2,022.28 කට සමාන සියයට 19 ක් 2022 දෙසැම්බර් 31 දිනට භාවිතයට ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2022.12.31 දිනට ඉතිරි ණය මුදල රු. මිලියන 660.00 ක් වූ අතර එම ණය ඉතුරුම් ඔරුගොඩවත්ත - අඹතලේ පාර අංක. 4/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යොදා ගැනීමට තීරණය කරන ලදී. | ව්‍යාපෘති කාල සීමාව තුළ අරමුදල් භාවිතා කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා අයවැයෙන් වෙන් කර ඇති මුදල රු. මිලියන 192.82 ක් වූ අතර එයින් ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 117.06 ක් පමණක් භාවිතා කර තිබුණි. ඉදිකිරීම්වල දුර්වල ක්‍රියාකාරිත්වය සහ ප්‍රමාදය එම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා ඇති බව නිරීක්ෂණය විය. | රජයේ දායකය සඳහා ප්‍රමාණවත් අරමුදල් නොලැබීම හේතුවෙන්, රු. මිලියන 4.9 ක් පමණක් භාවිතා කළ හැකි විය. | ව්‍යාපෘති කාල සීමාව තුළ අරමුදල භාවිතා කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවට අනුව, ඔරුගොඩතත්ත - අඹතලේ මාර්ගයේ 4/3, 6/1 සහ 6/2 පාලම් ප්‍රතිසංස්කරණය කිරීම පිළිවෙළින් 2021 ජනවාරි 02 සහ 2021 අප්‍රේල් 13 යන දිනවලදී අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, සැබවින්ම පාලම් තුන සම්පූර්ණයෙන් නිම කිරීම 2023 ජුනි 06 දක්වා දීර්ඝ කර තිබුණි. මේ අනුව, ඉදිකිරීම්වල දින දීර්ඝ කිරීම් කාලය අවසන් වනතුරු ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය පවත්වාගෙන යාමට සිදුවීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම ව්‍යාපෘති පිරිවැය ඉහළ යාමට සෘජුවම බලපා ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියට රු. මිලියන 0.93 ක මුදලක් ආර්ථික නොවන ලෙස දැරීමට සිදු විය. | ජල සම්පාදන මණ්ඩලය ඔවුන්ගේ නව නල මාර්ගය ඇතිරීම අවසන් කරන තුරු ප්‍රධාන ඉතිරි වැඩ ඉටු කිරීමට නොහැක. | අතිරේක පිරිවැයකින් තොරව ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |
| (ආ) | 2022 අප්‍රේල් 09 දින ආරම්භ වූ ණය වලංගු කාලය දීර්ඝ කිරීමට අදාල අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සම්බන්ධ තොරතුරු විගණනට ඉදිරිපත් කර නොතිබුණි. | සංවර්ධන සඳහා සෞදි අරමුදල විසින් ව්‍යාපෘතියේ ණය වලංගු කාලය 2023.12.31 දක්වා දීර්ඝ කරන ලදී. | ණය කාලය දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |

## 3.5 පද්ධති හා පාලන

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් මාසය සඳහා වන ප්‍රගති වාර්තාව සහ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 4/3, 6/2 සහ 6/1 පාලම් පුළුල් කිරීමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ හා අවසන් කිරීම සම්බන්ධයෙන් සඳහන් දිනවල වෙනස්කම් දක්නට ලැබුණි. | මෙය වැරදීමක් වන අතර සංඛ්‍යා නිවැරදි කර ඇත. | නිවැරදි ලේඛන සාක්ෂි පවත්වා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ විවිධ විදේශ ආධාර සහිත ව්‍යාපෘති අතර පොදු වියදම් (වාහන වියදම්, කුලී, ජල බිල්පත්, පිරිසිදු කිරීමේ වියදම්) වෙන් කිරීම සඳහා ක්‍රමවත් සහ විශ්වාසදායක ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | එක් එක් මාසය තුළ ප්‍රතිපාදන, අග්‍රිම ලැබෙන ප්‍රමාණය සහ එක් එක් ව්‍යාපෘතිය සඳහා සමස්ථ ව්‍යාපෘති පිරිවැය මත වියදම් බෙදාහරිනු ලැබේ. | පොදු වියදම් බෙදා හැරීම සඳහා සුදුසු ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති පිරිවැය අවම කිරීම සඳහා ව්‍යාපෘති භාරදීමේ සහතිකය ලබා දෙන දිනය වනවිට ඉතිරිව ඇති වැඩ නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි වැඩ නිම කිරීම ප්‍රධාන වශයෙන් ජල සම්පාදන මණ්ඩලයේ කාර්යයන් මත රඳා පවතී. කෙසේ වෙතත්, එම කාර්යයන් හැර අනෙකුත් සියලුම ඉතිරි වැඩ නිම කර ඇත. | අතිරේක පිරිවැයකින් තොරව ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |